කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලාව 2013

වාර්ෂික පරීක්ෂණය (2015 ඔක්තෝබර් - නොවැම්බර්)

ආර්ථිකවිද්‍යාව

ECON 53115/ M 06 : ආර්ථික විද්‍යාව සඳහා පර්යේෂණ ක්‍රම

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

---

01. (i) පර්යේෂණවල සම්භවය සහ පරිණාමය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

(ලකුණු 10)

(ii) පර්යේෂණවලදී සමාජීය විද්‍යා පර්යේෂකයන් 'විද්‍යාත්මක ක්‍රමවේදය' අනුගමනය කරන්නේ මන්දැයි නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

02. (i) සමාජීය විද්‍යා පර්යේෂණවලදී 'සිව් වැදෑරුම් මූලධර්මවල' කාර්යභාරය නිදසුන් ( භාවිතයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) 'පර්යේෂණ ආචාරධර්ම' යන්නෙන් කුමක් අදහස් කරන්නේ ද? පර්යේෂණයකදී පර්යේෂණ ආචාරධර්ම පිළිපැදීමේ වැදගත්කම පහදන්න.

(ලකුණු 10)

03. 'ඕනෑම පර්යේෂණයකදී පර්යේෂණ ගැටලුව ගොඩනැංවීම වැදගත් පියවරක් වේ. කෙසේ නමුත් පර්යේෂණ ගැටලුව හඳුනා ගැනීම සහ ගොඩනැංවීම අභියෝගාත්මක කාර්යයක් විය හැකි ය'. පැහැදිලි කරන්න.

(ලකුණු 20)

04. (i) ප්‍රමාණාත්මක දත්ත හා ගුණාත්මක දත්ත අතර පවත්නා වෙනස දක්වන්න. (ලකුණු 06)

(ii) ගුණාත්මක පර්යේෂණවල ලක්ෂණ මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 06)

(iii) පර්යේෂණ ක්‍රියාවලියට සම්බන්ධ විවිධ පියවර විස්තර කරන්න. (ලකුණු 08)

05. (i) නියැදුම් න්‍යායේ ප්‍රධාන අරමුණු මොනවා ද? (ලකුණු 04)

(ii) ප්‍රාථමික දත්ත රැස්කිරීමේ විවිධ ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත (ii) කොටසේ ඔබ විස්තර කල සෑම ක්‍රමයකම වාසි සහ අවාසි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

06. (i) නියැදි සමීක්ෂණයක ප්‍රධාන පියවර සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 07)

(ii) කල්පිතයක් යන්නෙන් ඔබට වැටහෙන්නේ කුමක් ද? (ලකුණු 02

ව්‍යවහාරික පර්යේෂණයකදී කල්පිතයක් වැදගත් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

ව්‍යවහාරික පර්යේෂණයකදී කල්පිතයක් ගොඩනගා ගන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 04)

(iii) සම්භාවිතා නියැදිම හා සම්භාවිතා නොවන නියැදිම අතර වෙනස පැහැදිලි කර ඒවායේ ප්‍රබලතා සහ දුබලතා විස්තර කරන්න. (ලකුණු 05)

07. (අ) මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගේ හැසිරීම සම්බන්ධ නියැදි සමීක්ෂණයක් සිදු කිරීමට ඔබට පවරා ඇතැයි සිතන්න.

(i) මේ නියැදි සමීක්ෂණය සඳහා වඩාත් යෝග්‍ය නියැදුම් ක්‍රමය හඳුනා ගන්න. නියැදිය තෝරා ගැනීමේදී එම නියැදුම් ක්‍රමය යෝග්‍ය වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(ii) ඉහත (i) කොටසේ විස්තර කළ නියැදුම් ක්‍රමයෙන් නියැදියක් තෝරා ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iii) මෙම සමීක්ෂණය සඳහා වඩාත් යෝග්‍ය දත්ත රැස් කිරීමේ ක්‍රමය කුමක්දැයි විස්තර කරන්න.

(ලකුණු 02)

(ආ) පහත දැක්වෙන නියැදුම් ක්‍රම කෙටියෙන් හඳුන්වා ඒවායේ ප්‍රබලතා සහ දුබලතා විස්තර කරන්න.

(i) සරල සසම්භාවී නියැදිම
(ii) ස්තෘත සසම්භාවී නියැදිම
(iii) කොටස් නියැදිම
(iv) විනිශ්චය (Purposive) නියැදිම

(ලකුණු 10)